# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016

## Primary Piriven Year End Term Test - 2016

**3 වසර / Grade 3**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved)

සමාජ විද්‍යාව
**Social Science**

කාලය : පැය තුනයි
Time : Three hours

❖ **I වන කොටසේ ප්‍රශ්න සියල්ලටත් , II වන කොටසින් ප්‍රශ්න හතරකටත් පිළිතුරු ලියන්න.**

**I කොටස**

01. සුදුසු පිළිතුර යටින් ඉරක් අඳින්න.

i. ''සමාජ විද්‍යාව'' යන පදය මුලින් ම භාවිතයට පැමිණියේ,

i. 1939 දී ය ii. 1839 දී ය iii. 1739 දී ය iv. 1836 දී ය

ii. සමාජ විද්‍යා අධ්‍යයනයට යොදා නොගන්නා ක්‍රමවේදය වන්නේ,

i. නිරීක්ෂණ ii. සම්පරීක්ෂණ iii. නිගමනය iv. පර්යේෂණ

iii. ඔගස්ට් කොම්ට්ගෙන් පසු සමාජ විද්‍යාවේ වර්ධනයට ක්‍රියා නොකළ විද්‍යාඥයා වන්නේ,

i. හර්බට් ස්පෙන්සර් ii. එමිල් ඩුර්කයිම් iii. ඇරිස්ටොටල් iv. මැක්ස් වේබර්

iv. ''ආගමික ජීවිතයේ මූලික හරය'' කෘතිය හඳුන්වා දුන්නේ,

i. මැක්ස් වේබර්ii. කාල් මාක්ස් iii. එමිල් ඩුර්කයිම් iv. ඔගස්ට් කොම්ට්

v. සතර සංග්‍රහ වස්තුවක් නොවන්නේ,

i. දානය ii. අර්ථචර්යාව iii. ආත්මාර්ථකාමී iv. ප්‍රියවචන

vi. ක්‍රි. ව. 1505 දී අහඹු ලෙස ලංකාවට ගොඩ බැස්සේ,

i. ඉබන් බතුතා ii. හියුං සියැං iii. විජය කුමරු iv. ලොරෙන්සෝ ද අල්මේදා

vii. දෙවන පෑ තිස් රජු දවස ආරම්භ නොවූ පිරිවෙනක් වන්නේ,

i. තොටගමුවේ විජයබා පිරිවෙණ ii. ග්‍රන්ථාකාර පිරිවෙණ
iii. පධානඝර පිරිවෙණ iv. මයුරපාද පිරිවෙණ

viii. බ්‍රිතාන්‍ය මානව විද්‍යාවේ පියා වන්නේ,

i. රැල්ෆ් ලින්ටන් ii. රේමන්ඩ් විලියම්ස් iii. ඊ .බී. ටයිලර් iv. මැලිනොව්ස්කි

ix. යහපත් සමාජයක් සඳහා මග පෙන්වන ප්‍රධාන සූත්‍රයක් වන්නේ,

i. සිගාලෝවාද සූත්‍රය ii. වසල සූත්‍රය iii. ආටානාටිය සූත්‍රය iv. අග්ගඤ්ඤ සූත්‍රය

x. ඔගස්ට් කොම්ට්

i. ඇමරිකන් ජාතිකයෙකි. ii. ප්‍රංශ ජාතිකයෙකි. iii. ජර්මන් ජාතිකයෙකි.
iv. ජපන් ජාතිකයෙකි.

( ලකුණු 04 × 10 = 40 )

## II කොටස

02. i. සමාජ විද්‍යාව යනු කුමක් දැයි කෙටියෙන් ලියන්න.

ii. බෞද්ධ භික්ෂුවකට සමාජ විද්‍යා විෂය අධ්‍යයනය කිරීමේ ඇති වැදගත්කම පහදන්න.

( ලකුණු 07 + 08 = 15)

03. i. පැරණි සමාජ ලක්ෂණ පහක් නම් කරන්න.

ii. සමාජ පරිණාමය පිළිබඳ බෞද්ධ මතය කෙටියෙන් පැහැදිලි කරන්න.

( ලකුණු 07 + 08 = 15)

04. i. විහාරස්ථානයකින් සමාජයට වන සේවාවන් පහක් ලියන්න.

ii. සංස්කෘතිය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

( ලකුණු 07 + 08 = 15)

05. i. ත්‍රිමූර්තිය නම් කරන්න.

ii. මහින්දාගමනයෙන් රට ස්වයංපෝෂිත වූ අයුරු සැකවින් දක්වන්න.

( ලකුණු 07 + 08 = 15)

06. i. සමාජයක් යනු කුමක් ද?

ii. සමාජානුයෝජනය සමාජයේ යහපැවැත්මට හේතු වේ. කෙටියෙන් පෙන්වා දෙන්න.

( ලකුණු 07 + 08 = 15)

07. i. සමාජ ප්‍රශ්න පහක් නම් කරන්න.

ii. බුදු දහමට අනුව සමාජ ප්‍රශ්නයක් විසඳා ගන්නේ කෙසේ දැයි කෙටියෙන් දක්වන්න.

( ලකුණු 07 + 08 = 15)